“මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ, තම පරමාධිපතියාණන් ඔහුගේ ආවරණය ඔහු මත තබන තරමට දේවත්වය විශ්වාස කරන්නා ඔහු වෙත සමීප කරවනු ලැබේ. පසුව ඔහුගේ පාපයන් පිළිගන්නට සළස්වයි

සෆ්වාන් ඉබ්නු මුහ්රිස් තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. 'අල්ලාහ්ගේ හමුව සම්බන්ධයෙන් අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයවලට ඔබ කවර ආකාරයෙන් සවන් දී ඇත්තේ දැ?' යි මිනිසකු ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමාගෙන් විමසන ලදී. එවිට එතුමාණන් මෙසේ ප්රකාශ කරනු මම සවන් දී ඇත්තෙමි යැයි හෙතෙම ප්රකාශ කළහ. “මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ, තම පරමාධිපතියාණන් ඔහුගේ ආවරණය ඔහු මත තබන තරමට දේවත්වය විශ්වාස කරන්නා ඔහු වෙත සමීප කරවනු ලැබේ. පසුව ඔහුගේ පාපයන් පිළිගන්නට සළස්වයි. පසුව "ඔබ මෙය දන්නෙහි ද?" යැයි විමසයි. එවිට 'මාගේ පරමාධිපතියාණනි! එසේය, මම දනිමි' යැයි ඔහු පවසයි. පසුව මෙලොවෙහි සැබැවින්ම ඔබට
එරෙහිව තිබූ දෑ මම වසන් කළෙමි. අද දින ඔබ වෙනුවෙන් ඒවාට සමාව දුනිමි. පසුව ඔහුට
ඔහුගේ යහපත් කුසල්හි පත්රිකාව දෙනු ලැබේ. දේවත්වය ප්රතික්ෂේප කළ කාෆිර්වරු හා කුහකයෝ වනාහි, 'අල්ලාහ්ට එරෙහිව බොරු කළවුන් මොවුහුය' යැයි පෙන්වා දෙමින්
සියලුම මැවීම්වලට ඉහළින් ඔවුන් අමතනු ලැබේ." [صحيح] [متفق عليه]

මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් දේවත්වය විශ්වාස කළ තම ගැත්තා සමග වන හමුව ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ දන්වා සිටියහ. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ දේවත්වය විශ්වාස කරන ගැත්තා තම පරමාධිපති වෙත සමීප කරනු ලබන අතර, අන් කිසිවෙකුට එබී බැලිය නොහැකි සේ ආවරණය කරයි. එවිට ඔහුට මෙසේ පවසයි: පසුව 'ඔබ මේ මේ දේ දන්නෙහි ද?' යැයි විමසා, ගැත්තා හා ඔහුගේ පරමාධිපතියාණන් අතර සිදු වූ පාපයන් ඔහුට පිළිගන්නට සළස්වයි. එවිට ඔහු 'මාගේ පරමාධිපතියාණනි! එසේය' යැයි ඔහු පවසයි. අවසානයේ දේවත්වය විශ්වාස කළ මුඃමින්වරයා බිය වූ විට, අල්ලාහ් ඔහුට මෙසේ පවසයි: "මෙලොවෙහි සැබැවින්ම ඔබට එරෙහිව තිබූ දෑ මම වසන් කළෙමි. අද දින ඒවා වෙනුවෙන් ඔබට මම සමාව දුනිමි." පසුව ඔහුට ඔහුගේ යහපත් කුසල්හි පත්රිකාව දෙනු ලැබේ. දේවත්වය ප්රතික්ෂේප කළ තැනැත්තා හා කුහකයා වනාහි, 'අල්ලාහ්ට එරෙහිව බොරු කළවුන් මොවුහුය' යැයි පෙන්වා දෙමින් සියලුම මැවීම්වලට ඉහළින් ඔවුන් අමතනු ලබති. අපාරාධකරුවන් හට අල්ලාහ්ගේ ශාපය අත් නොවේ ද!

http://www.sunnah.global/hadeeth/si/show/4242